# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2157/43 - 2020 ජනවාරි මස 09 වැනි බ්‍රහස්පතින්දා - 2020.01.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : පීඑස්/එස්ජ්/00/1/14/10

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති**

**ගෝඨාභය රාජපක්ෂ මැතිතුමන් විසිනි**

මුද්‍රාව

ගෝඨාභය රාජපක්ෂ

1. ගරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා
   විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
2. සුහද ගමලත් මැතිතුමා
   විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
3. ඩී.එම්. ගුණසේකර මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ බැංකුකරු

වෙත,

ශුභාශිංසන පූර්වකවයි!

මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් සිදු කරන ලදැයි කියන වැරදි ක්‍රියා, අක්‍රමිකතා සහ අයථා ක්‍රියාවන් මගේ දැන ගැනීමට යොමු කරනු ලැබ ඇති හෙයින් ද;

තවද, මේ අධිකාර පත්‍රය යටතේ ඉහත කී කාරණය පිළිබඳ විමර්ශන හා පරීක්ෂණයන්හි විෂයය ප්‍රමාණය මගින් ශ්‍රී ලංකා මහ බැංකුව (මෙහි මින්මතු CBSL යනුවෙන් සඳහන් කරනු ලබන) ඇතුලු අදාළ බලධාරීන් විසින් සිය ව්‍යවස්ථාපිත හා නෛතික වගකීම් ක්‍රියාත්මක කිරීම කෙරෙහි කිසිදු ආකාරයකින් බාධකයක් පනවාලීමක් සිදු නොවන බවත් සැලකිල්ලට ගනිමින් හා එකී ලිඛිත නීති ප්‍රකාරව කටයුතු කිරීම සලකා බැලීම සහ හැකි අවස්ථාවන්හි ගත හැකි ක්‍රියාමාර්ග තවදුරටත් ඉටුකරලීමට, මෙම අධිකාරී පත්‍රය ප්‍රකාරව පවත්වනු ලබන පරීක්ෂණ හා විමර්ශන නොතකා, එකී අදාළ බලධාරීන් අදාළ ලිඛිත නීතීන් ප්‍රකාරව බලගන්වන බව සැලකිල්ලට ගනිමින්ද ;

මෙම අධිකාර පත්‍රය යටතේ මෙම විමර්ශනය හා පරීක්ෂණය පවත්වනුයේ ඉහත කී ආකාරයෙන් සිය ව්‍යවස්ථාපිත හා නෛතික වගකීම් ඉටු කරලීමේදී ශ්‍රී ලංකා මහ බැංකුව ඇතුලු අදාළ බලධාරීන් විසින් ගනු ලැබ ඇති හෝ ගනු ලබන කිසියම් ක්‍රියාමාර්ගයන්ට අමතරව හා ඒවාට අගතියක් සිදු නොවන පරිදි බැව් සැලකිල්ලට ගනිමින්ද ;

තවද, මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු පිළිබඳව විමර්ශනයක් හා පරීක්ෂණයක් පවත්වා එබඳු කරුණුවලට අදාළව සිදු කරන ලදැයි කියන එබඳු වැරදි ක්‍රියා, අක්‍රමිකතා හෝ අයථා ක්‍රියාවන් සත්‍ය බැව් හෙළි වෙතොත් එකී වැරදි ක්‍රියා, අක්‍රමිකතා හෝ අයථා ක්‍රියාවන්ට සම්බන්ධ වූ හෝ එයට වගකිව යුතුව ඇති කිසියම් තැනැත්තකු හෝ තැනැත්තන් වෙතොත් හඳුනාගනු පිණිස තොරතුරු ලබා ගැනීම අවශ්‍ය යැයි මට පෙනී යන හෙයින් ද;

තවද, එබඳු ක්‍රියාවන් ඉදිරියේ දී යළි සිදු නොවීම සහතික කරගනු පිණිස කිසියම් ප්‍රතිකර්මදායී සහ / හෝ නිවාරණ ක්‍රියා මාර්ග ගනු ලැබිය යුතුදැයි යන්න නිශ්චය කරලනු වස් මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් විමර්ශනයක් සහ පරීක්ෂණයක් පැවැත්වීම ජාතික යහපත උදෙසා අවශ්‍ය යැයි මා අදහස් කරන හෙයින් ද;

තවද, මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු පිළිබඳව විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම හා වාර්තා කිරීම පිණිස පරීක්ෂණ කොමිෂන් සභාවක් පත් කිරීම අවශ්‍ය යැයි මා අදහස් කරන හෙයින් ද;

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති ධුරන්ධර ගෝඨාභය රාජපක්ෂ වන මම, ඔබතුමන්ලා ගේ විචක්ෂණභාවය, සාමාර්ථය සහ විශ්වාසවන්තභාවය කෙරෙහි මහත් වූ භක්තිය හා විශ්වාසය තබමින්, සංශෝධිත පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය වන) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාර,

1. ගරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා
   විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු
2. සුහද ගමලත් මැතිතුමා
   විශ්‍රාමික සොලිසිටර් ජනරාල්
3. ඩී.එම්. ගුණසේකර මැතිතුමා
   ජ්‍යෙෂ්ඨ බැංකුකරු

වන ඔබතුමන්ලා මතු දැක්වෙන කරුණු විමර්ශනය කිරීම, පරීක්ෂා කිරීම සහ වාර්තා කිරීම පිණිස මගේ කොමසාරිස්වරුන් ලෙස මෙමගින් පත් කරමි.

එකී කරුණු කවරේද යත් -

(අ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ පරිපාලනය, කළමනාකරණය, කර්තව්‍යයන් සහ කටයුතු පවත්වා ගැනීම සම්බන්ධයෙන් යම් නීති කඩවීමක් සිදුවී තිබේද යන වග;

(ආ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු වලට අදාළව රජයට සහ / හෝ මහජනයාට අලාභයක් හෝ හානියක් සිදුවීමට හේතුකාරක වන්නා වූ යම් වැරදි ක්‍රියාවක්, අක්‍රමිකතාවක් හෝ අයථා ක්‍රියාවක් හෝ එබඳු පරිපාලනය, කළමනාකරණය, කර්තව්‍යයන් සහ කටයුතු පවත්වාගෙන යාමට අදාළව නෛතිකව ස්ථාපිත කාර්ය පරිපාටීන්ට අනුකූලව ක්‍රියා නොකිරීමක් හෝ එකී කාර්ය පරිපාටින් නොසලකාහැරීමක් සිදුවී තිබේ ද යන වග;

(ඇ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් රජයට සහ / හෝ මහජනයාට අලාභයක් හෝ හානියක් සිදුවීමට හේතුකාරක වූ කිසියම් ගිවිසුම්ගත බැඳීමකට වංචනික ලෙස හෝ අවංකභාවයෙන් තොරව හෝ නොසැලකිලිමත්ව එළඹ තිබේ ද යන වග;

(ඇ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් රජය වෙනුවෙන් අදාළ ගිවිසුම් හෝ කොන්ත්‍රාත්වලට එළඹීමේ දී අදාළ වන නෛතිකව ස්ථාපිත කාර්ය පරිපාටින්ට අනුකූලව ක්‍රියා නොකිරීමක් හෝ නොසලකා හැරීමක් සිදුවී තිබේ ද යන වග;

(ඉ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් නෛතිකව ස්ථාපිත කාර්ය පරිපාටීන්ට අනුකූලව ක්‍රියා නොකිරීමක් හෝ නොසලකා හැරීමක් හේතුවෙන් මෙහි උපලේඛනයෙහි සඳහන් නෛතික ආයතන අවිධිමත් ලෙස හෝ අක්‍රමවත් ලෙස හෝ අත්තනෝමතික ලෙස විකිණීමක් සිදුවී තිබේ ද යන වග;

(ඊ) පොදු යහපත උදෙසා ප්‍රශස්ත මිලක් ලබා ගැනීම සහතික කරගනු පිණිස මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු සම්බන්ධයෙන් අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම ඇතුළුව නෛතිකව ස්ථාපිත කාර්ය පරිපාටීන්ට අනුකූලව ක්‍රියා කර තිබේ ද යන වග;

(උ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු වලට අදාළව, රජයට සහ / හෝ මහජනයාට එබඳු පාඩුවක් හෝ හානියක් ඇති වීමට හේතුකාරක වූ යම් නීති විරෝධී ක්‍රියාවකට, පැහැර හැරීමකට හෝ හැසිරීමකට හා සම්බන්ධ වූ හෝ ඊට වගකිව යුතු තැනැත්තා හෝ තැනැත්තන් කවුරුන් ද යන වග;

(ඌ) මෙහි උපලේඛනයෙහි දක්වා ඇති කරුණු වලට අදාළ වන, දූෂිත ක්‍රියාකාරකමකට සම්බන්ධිත බලය අනිසි ලෙස යෙදවීම හෝ අවභාවිතය, බලපෑම් කිරීම, අයුතු ලෙස මැදිහත්වීම, වංචාව, අයථා ක්‍රියාව, ඥාති සංග්‍රහය හෝ යම් ක්‍රියාවක් හෝ පැහැර හැරීමක් සිදුව තිබේ ද යන වග;

සහ මේ අධිකාරී පත්‍රයෙහි නියමයන් යටතේ විමර්ශනය කරනු ලැබ ඇති හෝ පරීක්ෂා කරනු ලැබ ඇති මෙහි උපලේඛනයෙහි සඳහන් කරුණු සම්බන්ධයෙන් නිර්දේශ ඉදිරිපත් කිරීම.

තවද, ඉහත කී, විශ්‍රාමික ශ්‍රේෂ්ඨාධිකරණ විනිසුරු, ගරු කේ.ටී. චිත්‍රසිරි මැතිතුමා වන ඔබතුමන්, කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස මම මෙයින් පත් කරමි.

තවද, පූර්වෝක්ත කරුණු පිළිබඳව ඔබහට පෙනී යන පරිදි අවශ්‍ය විය හැකි පරීක්ෂණ සහ සියලුම විමර්ශන පැවැත්වීමට ඉහත කී කොමසාරිස්වරුන් වන ඔබහට මෙයින් බලය හා අධිකාරිය පවරන අතරම, ඔබ ගේ පරීක්ෂණයන්ගෙන් අනාවරණය වන කරුණු සහ ඔබ ගේ නිර්දේශ ගෙනහැර දක්වමින් ඔබගේ අත්සනින් යුතුව එකී කරුණු පිළිබඳව වාර්තාවක් මේ අධිකාරී පත්‍රයෙහි දින සිට මාස තුනක් (03) ක් ඇතුළත මා වෙත එවන ලෙස මම ඔබහට නියම කරමි.

තවද, පූර්වෝක්ත කාරණා වලට අදාළ වන කිසියම් විමර්ශනයක හෝ පරීක්ෂණයක යම් කොටසක් ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු බවට ඔබේ අභිමතය පරිදි නිශ්චය කරනු ලැබේ නම්, එම කොටස ප්‍රසිද්ධියේ නොපැවැත්විය යුතු යැයි මම ඔබට නියම කරමි.

තවද, ඔබගේ විමර්ශනයන්හි හෝ පරීක්ෂණයන්හි කාර්යයන් සඳහා ඔබ විසින් සහාය හෝ තොරතුරු ඉල්ලා සිටිය හැකි සියලුම රජයේ නිලධරයන්, ව්‍යවස්ථාපිත මණ්ඩලයන්හි නිලධරයන් සහ වෙනත් තැනැත්තන් විසින් තත්කාර්යය සඳහා නිසි පරිදි දෙනු ලැබිය හැකි සියලුම සහාය දිය යුතු යැයි ද, සපයනු ලැබිය හැකි සියලුම තොරතුරු සැපයිය යුතු යැයි ද මෙයින් නියම කොට විධාන කරමි.

පූර්වෝක්ත පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියෙහි විධිවිධාන, මේ කොමිෂන් සභාවට අදාළ විය යුතු බව මෙම මෙයින් ප්‍රකාශ කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් විස්සක් වූ ජනවාරි මස 09 වන දින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී.බී. ජයසුන්දර
ජනාධිපති ලේකම්

උපලේඛනය

1. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලැබුවාවුත්, බරපතල මූල්‍ය ගැටළුවලට මුහුණ පෑම නිසාවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මැදිහත්වීමට සහ ස්වකීය තැන්පත්කරුවන් ගේ ගනුදෙනු බේරුම්කිරීම සඳහා වත්කම් විකිණීමට හේතුවූත් මූල්‍ය සමාගමක් වන ඊටීඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (ඊටීඅයි) සමාගම සම්බන්ධයෙන් සිදුවිණැයි කියන වැරදි ක්‍රියා, අක්‍රමිකතා සහ අයථා ක්‍රියා. මෙකී වත්කම්වලට ස්වර්ණමහල් ෆිනෑන්ෂල් සර්විසස් පීඑල්සී, ඊඒපී බ්‍රෝඩ්කාස්ටිං කම්පැනි ලිමිටඩ් සහ එහි අනුබද්ධ සමාගම්, ඊඒපී ෆිල්ම්ස් ඇන්ඩ් තියටර්ස් ලිමිටඩ් (සහ එහි පාලිත සමාගම්); හෝටල් සැෆයර් (පුද්) සමාගම; ස්වර්ණමහල් ජුවලර්ස් ලිමිටඩ්; සහ ඊටීඅයි ෆිනෑන්ස් පීඑල්සී සමාගම සතු වෙනත් නිශ්චල වත්කම් ඇතුළත් වේ.

2. විදේශිකයින් විසින් මාධ්‍ය ආයතනයන්හී අයිතිය ලබා ගැනීම පිළිබඳව ශ්‍රී ලංකාවේ නීති යටතේ පරිසීමා කිරීම් කඩකරලමින් ඉහත ආයතන, බිලූ සමිට් කැපිටල් මැනේජ්මන්ට් ප්‍රයිවට් ලිමිටඩ් සහ බෙන් හෝල්ඩිංග්ස් ප්‍රයිවට් ලිමිටඩ් යන සමාගම් වලින් සැදුම්ලත් මූල්‍ය ආයතන සමූහයකට (කොන්සෝටියම්) විකිණීම.

3. විදේශිකයින් විසින් නිශ්චල දේපළ මිලදී ගැනීම තහනම් කෙරෙන ශ්‍රී ලංකාවේ නීති කඩකරලමින් එකී පාර්ශවයට "ඊටීඅයි" ආයතනයෙහි වත්කම් විකිණීම.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.